

# ප්‍රභාකරන් මැරුවේ කවුද?

ප්‍රභාකරන්ගේ මරණය සිදුවූයේ කෙසේද යන්න සම්බන්ධයෙන් දැන් දෙමළ ජනයා අතරේ කසුකුසු පැතිරෙන්නට පටන්ගෙන ඇත. ඇතැම් ඉන්දියානු පුවත් පත් වලද ළඟදී පළවූයේ ප්‍රභාකරන්ගේ ඝාතනය ඇතුළත වැඩක් බවයි. එනම් මේ තාක් ප්‍රකාශවී තිබුණු අන්දමට ශ්‍රීලංකා රජයේ යුද හමුදා වෙඩි උණ්ඩයකින් නොව ළඟින්ම සිටි කිසිවෙකු විසින් පසුපසින් හිසට තබන ලද වෙඩිපහරක ප්‍රතිඵලයක් වශයෙන් කොටිනායකයා මිය යන්නට ඇති බවය.

එසේ නම් ඔහුගේ පිටුපසින් ළඟම සිටියේ කවුද? මෙහිදී බොහෝ දෙනාගේ සැකය එල්ල වෙන්නේ පොට්ටු අම්මාන් වෙතය. ඔහු ප්‍රභාගේ අතිශය සමීපතම සගයාය. ඔහුගේ සියළු රහස් දැන සිටි, එමෙන්ම ඔහු හමුවන්නට ඕනෑම වේලාවක පැමිණෙන්ට අවසර තිබූ තැනැත්තාය. ප්‍රභාකරන් අයුධ සන්නද්ධ බොඩිගාඩ්ලා 300 ක් වටකර ගෙන සිටියේය. ඒ නිසා පසුපසින් ඔහුට වෙඩි තබන්නට කාටවත් බැරිය. එය කළහැක්කේ ඒ කාඩරයන්ට වඩා ඉහළ කෙනෙකුට පමණය. අප්‍රියෙල් අවසානයේදී ඊළම් යුද්ධය නිසැකවම පරාජය වන බව පෙනුණ නිසා ඇතිවූ කළකිරීමෙන් පොට්ටු අම්මාන්ගේ සිතෙහි ප්‍රභාකරන් කෙරෙහි දැඩි වෛරයක් හටගන්නට ඇති බවත් ඒ නිසා ඔහු ප්‍රභාගේ හිසට වෙඩිතබන්නට ඇති බවත් කියති.



**Last year's picture of Prabhakaran at a ceremony in Mulathivu, handing a present to his most trusted cadre Pottu Amman in praise of his services to LTTE struggle.**

**මේ පින්තූරයෙන් දැක්වෙන්නේ ගිය වසරේ මුලතිව්හි පැවති කොටින්ගේ උත්සවයකදී ප්‍රභාකරන් සිය ඉතා හිතේෂිවන්ත සගයා වන පොට්ටු අම්මාන්ට ත්‍යාගයක් පිරිනමන ආකාරයයි.**

# Did Pottu Kill Prabha?

New evidence is surfacing to show that the death of Prabhakaran, the LTTE supremo was a retribution killing and that it was an 'insider job'. It negates the view held thus far that Prabhakran was killed by an army bullet.

But it is still not clear who killed him and why, though the needle of suspicion points to Pottu Amman the only a person who was very close to him, in whom Prabhakaran had absolute confidence, and whose movements did not raise suspicions. So much so, it is not easy to shoot him in the back of his head. Only someone who was far above the commandos in the hierarchy and yet remained a shadow of the 'boss' could have betrayed the trust, and killed Prabha. In this case, Pottu fits the bill.





වර්ල්ඩ් එයාර් ට්‍රැවල්ස්

WORLD AIR TRAVELS

SPECIAL OFFERS TO COLOMBO

World Air Travels Ltd.
51 Ringwood Avenue
Redhill , Surrey RH1 2DY
Mob - 078 65081261
Off - 01737 780338
e-mail - dilhan@worldairtravels.co.uk


## ♥ පැටියො ඩාලිං



" පැටියො මම ඊයෙ ලංකාවට කතාකරපු වෙලාවෙ නැන්දගෙන් ඇහුවා දැන් යුද්දෙන් පස්සෙ කොහොමද? කියලා.... මගෙන් ඇහුවා මොන යුද්දෙද? කියලා...."

" හැබැට....? හෙට කතාකරලා රණවිරුවො ගැන ඇහුවොත් ඒත් ඉතින් එච්චර තමයි....! "


Sam's

CHICKEN
CHICKEN
CHICKEN

සැම්ස් චිකන්

Great Tasting! Great Value!

17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432


# Sinhala Lesson 134 සිංහළ පාඩම

## සිංහල ඉගෙනීමට පහසු මගක් !

### වෙලාව කීම Telling the time

වෙලාව කීයද? **What is the time?**
වෙලාව තුනයි. **It's three o'clock.**

When the time is on the **hour** we say : වෙලාව තුනයි, හතරයි, පහයි, හයයි, හතයි, අටයි, නමයයි, දහයයි, එකොළහයි, දොළහයි, එකයි, දෙකයි

When it is **half past an hour** we say : එක හමාරයි, දෙක හමාරයි, තුන හමාරයි, හතර හමාරයි, පහ හමාරයි etc.

When it is **quarter past**, we say එකයි කාලයි, දෙකයි කාලයි තුනයි කාලයි, හතරයි කාලයි, පහයි කාලයි etc.

When it is **quarter to**, we say When it is quarter එකට කාලයි, දෙකට කාලයි, තුනට කාලයි, හතරට කාලයි etc.

When we want to say that a **certain number of minutes are to a certain hour**, we say දෙකට පහයි, හතට දහයයි, අටට විස්සයි, අටට අටයි etc.

When a certain number of minutes is **past the hour**, we say දෙකයි විස්සයි, අටයි දහයයි, දොළහයි හතළිහයි etc.

***Practise telling the time in Sinhala with someone else and also writing it.***

***Practise Sinhala speaking, reading and writing.***

♦ ආචාර්‍ය සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

## හරස්පද ප්‍රහේලිකා 109

**හරහට :**
1 රජ්ජුරුවන්ගෙ පුතා
5 අයිස් වතුර
7 පිම්බීම
8 අවසානය
10 ඇට විශේෂයකි

**පහළට :**
1 කම්මැලියා
2 මම මහත බව කියන ගම
3 මුහුදේ ඇත
4 කන්නලව්ව
6 අපායේ ලොක්කා
9 විස්වාසයක් නැති දවස

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | ■ |
| 5 | | | | 6 |
| 7 | | ■ | 8 | |
| | ■ | 9 | ■ | |
| ■ | 10 | | | |

***ගියවර නිවැරදි විසඳුම්***

**හරහට :** 1 අපවාද 5 කටයුත්ත 7 මැල 8 තරු 10 සුළුපියා
**පහළට :** 1 අකමැති 2 පටල 3 වායු 4 දත්ත 6 තරුණයා 9 පලු

## නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

### මාළු සලාදයක්
### Fish Salad

***අවශ්‍ය ද්‍රව්‍ය :*** ගල් මාළු හෝ වෙනත් සුදු පැහැති
මාළු ග්‍රෑම් 250 ක්
බිත්තර (තම්බාගත්) 2 ක්
සලාද කොළ 2 ක්
පිපිඤ්ඤා ග්‍රෑම් 100 ක්
විනාකිරි තේ හැඳි 3 ක්
සීනි තේ හැඳි 1 ක්
අබ තේ හැඳි 1 ක්
එළවළු තෙල් ස්වල්පයක් හා පාස්ලි ටිකක්
ලුණු හා ගම්මිරිස් රස අනුව අවශ්‍ය පමණට

***සාදන ක්‍රමය :*** මාළුවල කටු හා හම ඉවත් කර කුඩා කැබලි වලට කපා ගන්න ඉන්පසු එය බඳුනකට දමා ලුණු ටිකක් හා ගම්මිරිස් ඇට ටිකක් එකතු කර තම්බා ගන්න.

සලාද කොළ සහ පිපිඤ්ඤා අඟල් ¼ ක ප්‍රමාණයට කොටු කපා ගන්න තම්බාගත් බිත්තර දෙකත් ඒ අයුරින්ම කපා ගන්න පාස්ලි ටික සිහින්ව ලියන්න.

බඳුනක් ගෙන එයට විනාකිරි, සීනි, අඹරාගත් අබ සහ තෙල් තේ හැඳි දෙක දමා හොඳින් මිශ්‍රකර ගන්න. එයට ලුණු සහ ගම්මිරිස් ද අවශ්‍ය ප්‍රමාණයට එක්කර ගන්න. මෙම මිශ්‍රණයට ඉහත සඳහන් මාළු, කපාගත් බිත්තර, පාස්ලි, පිපිඤ්ඤා සහ සලාද කොළ එකතු කර හොඳින් මිශ්‍රකර ගන්න.

♦ ***පුෂ්පා රණවීර*** Sri Lanka